# සංඛ්‍යාලේඛන ජිල්මාට් කතාව සජිත් සතියක් ඇතුළත ඔප්පු කළොත් මම මන්ත්‍රී කමෙන් ඉවත් වෙනවා

## බන්දුල ගුණවර්ධන

(මුදිතා දයානන්ද)

ලංකාව මැදි ආදායම්ලාභී රටක් ලෙස ලෝකයට තහවුරු කර තිබෙන්නේ සංඛ්‍යාලේඛන ජිල්මාට් එකකින් යැයි කර තිබෙන ප්‍රකාශයේ නිරවද්‍යතාව සජිත් ප්‍රේමදාස මහතා සතියක් ඇතුළත ඔප්පු කළහොත්, තමන් පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉවත් වන බව එක්සත් ජනතා නිදහස් සන්ධාන මන්ත්‍රී ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පෙරේදා (25) පැවසීය.



ඔහු මේ බව පැවසුයේ පුංචි බොරැල්ල වජිරාශ්‍රමයේදී පැවැති මාධ්‍ය හමුවකදී අදහස් දක්වමිනි.

**බන්දුල ගුණවර්ධන මහතා මෙසේ ද කීය.**

යුද්ධය පැවැති සමයේ බලයට පත්වුණ කාට වුණත් දුප්පත්කම නැති කිරීමේ හීන කොයිතරම් තිබුණත් ඒවා යථාර්ථයක් කරගන්න බැරි වුණා. මහින්ද රාජපක්ෂ මහතා යුද්ධයත් අවසන් කළා. රට ගොඩනැගීමත් ආරම්භ කළා. යුද ජයග්‍රහණයෙන් පසු සංවර්ධන ව්‍යාපෘති ඇතිවීම නිසා රට වැඩබිමක් බවට පත්වුණා. රටේ ආර්ථිකය ශක්තිමත් වුණා. ඒ නිසා 2010දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේ රට මැදි ආදායම් ලාභී රටක් ලෙස නම් කළා.

ජනගහනය හා ඔවුන්ගේ ආදායම් තත්ත්වයන් සම්බන්ධයෙන් වන සංඛ්‍යාලේඛන හදන්නේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන්. ඒවා අනුමත කර ප්‍රසිද්ධියට පත් කරන්නේ මහබැංකුවෙන්. සජිත් ප්‍රේමදාස මහතා කියන එක හරි නම් මේ ජිල්මාට් එක දාලා තියෙන්නේ ඒ ආයතන දෙකයි.

සජිත් ප්‍රේමදාස මහතා ඉදිරි ජනාධිපතිවරණයේ තමන්ගේ අපේක්ෂකයා යැයි එම පක්ෂයේ කීප දෙනකු විසින් නියත විවරණ ලබා දුන්නාට පස්සේ කළ මේ බරපතළ ප්‍රකාශය අපට නොසලකා හරින්න බැහැ. ඔහු කියනවා දුප්පත්කම සියයට හයයි නම් සමෘද්ධිලාභීන් සියයට විස්සක් ඉන්නේ කොහොමද කියලා.

මේ රට දුප්පත් කළේ මේ ආණ්ඩුව ආවට පස්සේ. ඔවුන් ආර්ථිකය ගොඩනගන කිසිම ව්‍යාපෘතියක් ගෙනාවේ නැහැ. ඒ වෙනුවට මහබැංකු හොරකම කරලා රටට හොරකම තහවුරු කළා.

සජිත් මහත්තයා මේ කරපු ප්‍රකාශය නිසා අපි රටක් ලෙස ලෝකය හමුවේ පහළට ඇද වැටෙනවා. ඒ නිසා මේක ඇත්ත කියලා ඔහු ඔප්පු කළ යුතුයි. එහෙම ඔප්පු කළොත් මම පාර්ලිමේන්තු මන්ත්‍රීකමෙන් ඉවත් වෙනවා.

**එහිදී අදහස් දැක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ශෙහාන් සේමසිංහ මහතා:**

මේ ආණ්ඩුව බලයට ආවට පස්සේ රට ණය බරින් නිදහස් කරනවා වෙනුවට තව තවත් ණය කළා. මේ වසර හතරට ඔවුන් අලුතෙන් බිලියන පන්දාහක ණය අරන්. ඒවායින් කරපු දෙයක් නැහැ. ණය බර බද්ද බර ලෙස ජනතාව මත පැටවීම පමණයි සිදුකර තිබෙන්නේ.

සජිත් ප්‍රේමදාස මහතාගේ වැඩසටහන්වලට රජයේ නාලිකාවල නිදහස් ගුවන් කාලයක් ලැබෙන්නේ කෙසේද කියලා ඔහු රටට හෙළි කළ යුතුයි. ඔහු මේ නාස්ති කරන්නේ ජනතාවගේ මුදල් යැයි ද මන්ත්‍රීවරයා කීවේය.